# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 27 දරන
# පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 ඔක්තෝබර් මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ඔක්තෝබර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 4.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

# 1997 අංක 27 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 ඔක්තෝබර් මස 21 වන දින]

එල්. ඩී.–ඕ. 14/97.

## පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1997 අංක 27 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— 383 වන අධිකාරයේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

> "(2) මේ පනතේ උපලේඛනයෙහි ('අ' කොටසේ හෝ 'ආ' කොටසේ හෝ වුවද) දැක්වෙන පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ සෑම කඩකිරීමක් ම, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, තත් කාර්ය සඳහා මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධාන යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, මේ කොටස යටතේ වූ වරදක් විය යුතු ය."; සහ

(2) ඒ වගන්තිය අගට පහත දැක්වෙන අළුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

> "(3) මේ පනතේ උපලේඛනයේ ආ කොටසේ සඳහන් වන්නා වූ ද පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් හෝ ඊට අදාළව සිදු කරන්නා වූ ද පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ සෑම කඩකිරීමක් ම, තත් කාර්ය සඳහා මෙහි සලස්වනු ලබන විධිවිධාන යටතේ පාර්ලිමේන්තුව විසින් දඬුවම් කරනු ලැබිය හැකි මේ කොටස යටතේ වූ වරදක් විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—D 045696—5,900 (97/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියෙහි, (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මේ පනතේ උපලේඛනයෙහි 'ආ' කොටසේ සඳහන් වන්නා වූ ද පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් හෝ ඊට අදාළව මන්ත්‍රීවරයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන්නා වූ ද පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ යම් කඩකිරීමක් සම්බන්ධයෙන් ලඝු ආකාරයෙන් දඬුවම් කිරීමට පාර්ලිමේන්තුවට බලය සහ අධිකරණ බලය තිබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන්:—

"උපලේඛනයෙහි 'ආ' කොටසේ දැක්වෙන වැරදි පිළිබඳ පාර්ලිමේන්තුවේ අධිකරණ බලය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තිය ඉවත් කිරීම.

5. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 27 අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනතින් සහ 1987 අංක 37 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

"පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි දඬුවම.

28. මේ කොටස යටතේ යම් වරදක් සඳහා පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි දඬුවම, පාර්ලිමේන්තුවේ සභා ගැබ සීමාවට කැඳවා අවවාද කිරීම හෝ සභා භූමියෙන් ඉවත් කිරීම හෝ විය යුතු ය:

එසේ වුව ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට මෙහි මින් පෙර සඳහන් යම් දඬුවමකට අමතරව හෝ යම් දඬුවමක් වෙනුවට, එක් මාසයක් නොඉක්මවන යම් කාලයක් තුළ පාර්ලිමේන්තුවේ සේවය කිරීමෙන් ඔහු අත්හිටවීමේ නියමයක් පාර්ලිමේන්තුව විසින් කරනු ලැබිය හැකි ය.

එසේ ම තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවන තැනැත්තකු විසින් සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට, හය මාසයක් නොඉක්මවන කාලයක් තුළ පාර්ලිමේන්තුවට හෝ එහි භූමියට හෝ ඇතුළුවීම ඒ තැනැත්තාට තහනම් කළ යුතු යයි නියම කිරීම ද පාර්ලිමේන්තුව විසින් කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"පාර්ලිමේන්තුව විසින් දඬුවම් කිරීමේ බලය සීමා කිරීම.

32. මේ පනතේ ඇතුළත් කිසිවකින් උපලේඛනයේ 'ආ' කොටසේ සඳහන් යම් වරදක් සඳහා මේ පනතේ 28 වන වගන්තියෙන් බලය දී ඇති යම් දඬුවමක් නියම කිරීම පිණිස වූ බලය හැරෙන්නට, යම් තැනැත්තකු කෙරෙහි යම් දඬුවමක් නියම කිරීමට යම් බලයක් පාර්ලිමේන්තුව වෙත නොපැවරෙන අතර එසේ පැවරෙන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

8. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ 'අ' කොටසෙහි දැක්වෙන ශීර්ෂ පාඨය වෙනුවට පහත සඳහන් ශීර්ෂ පාඨය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පමණක් ම දඬුවම් කළ හැකි වැරදි.".

අනානුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**9.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනානුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.